228104

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් හා පුවත්පත් පනත
රෙජිස්ට්‍රාර් කාර්යාලය
25-2-1991
ශ්‍රී ලංකා SRI LANKA இலங்கை

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 637/6—1990 නොවැම්බර් 20 වැනි අඟහරුවාදා—1990.11.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 2/71

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

1968 අංක 32 දරන පුද්ගලයන්, ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය සහ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, ඒ පනතේ 17 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

ආර්. ප්‍රේමදාස,
ජනාධිපති.

1990 ජූනි මස 25 වන දින,
කොළඹ දීය.

### නියෝග

1. මේ නියෝග 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (අළුත් හැඳුනුම්පත් නිකුත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1972 දී හෝ 1973 දී නිකුත් කරන ලද හැඳුනුම්පතක් දරන්නා වූ සෑම තැනැත්තකු විසින්ම, පවත්නා හැඳුනුම්පත ප්‍රතියෝජනය කිරීම පිණිස අළුත් හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබීම සඳහා මේ නියෝග ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින සිට මාස හයක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

3. 1972 දී හෝ 1973 දී හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබුවා වූද, ඉන් ඉක්බිතිව, එහි අනු පිටපතක් ලබාගෙන සිටින්නා වූ ද, යම් තැනැත්තකු විසින්, 2 වන නියෝගය යටතේ අළුත් හැඳුනුම්පතක් සඳහා ඉල්ලීමක් නොකළ යුතු ය.

4. 2 වන නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රයක්—

(අ) මෙහි උපලේඛනයේ දක්වා ඇති 'ඌ' ආකෘතියෙහි විය යුතුය;

(ආ) ඉල්ලුම්කරු විසින් අත්සන් කරනු ලැබ තිබිය යුතුය;

(ඇ) සහතික කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය ;

(ඈ) (i) පවත්නා හැඳුනුම්පත ප්‍රතියෝජනය කිරීම පිණිස අළුත් හැඳුනුම් පතක් නිකුත් කිරීම සඳහා 8 වන නියෝගය මගින් නියම කර ඇති ගාස්තුව සම්බන්ධයෙන්, එම ගාස්තුව අත්හැරීමේ සහතිකයක් ඒ නියෝගයේ (2) වන ඡේදය යටතේ ඉල්ලුම්කරු වෙත නිකුත් කර නොමැති නම්, එම ගාස්තුවේ වටිනාකමට මුද්දරයක් හෝ මුද්දර හෝ ඇලිය යුතු ය ;

නැතහොත්,

(ii) එවැනි සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබ ඇත්නම්, එම සහතිකය සමග එවා තිබිය යුතුය.

(ඉ) 1971 දෙසැම්බර් මස 30 වන දින අංක 14,991 දරන 'ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ' පළ කරන ලද, 1971 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ නියෝග වල 12 වන නියෝගයේ නියමිත දිග පළලින්, විස්තරවලින්, ප්‍රමිතීන් ගෙන් සහ තත්ත්වයෙන් යුතු වූ, මෑතකදී ගන්නා ලද, ඉල්ලුම්කරුගේ ඡායාරූපයක් නොඅලවන ලද පිටපත් තුනක් අමුණා තිබිය යුතු ය.

5. (1) මේ නියෝග යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, එම ඉල්ලුම්පත්‍රය මේ නියෝගවලට අනුකූල නොවීමේ හේතුව මත කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මිස, ඔහු විසින් පවත්නා හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම් පතක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින්, පවත්නා හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම් පතක් ඉල්ලා සිටින ඉල්ලුම්කරු වෙත විධානයක් කිරීමෙන්, ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට කොමසාරිස්වරයාට හැකි කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් නියමිත විස්තරවලට අදාළ වූද, එම විධානයෙහි සඳහන් වන්නා වූද, තොරතුරු හෝ ලියකියවිලි හෝ එම විධානයෙහි නිශ්චිත කාල සීමාවතුලදී කොමසාරිස්වරයා වෙත සපයන ලෙස විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානය අනුව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වුවහොත් කොමසාරිස්වරයා විසින් එම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) පවත්නා හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම්පතක් නිකුත් කිරීම (2) වන ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළ විට එම තීරණය ගැන සෑහීමකට පත් නොවන ඉල්ලුම්කරුවෙකුට, ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ බවට දැන්වීමක් කොමසාරිස්වරයාගෙන් ලැබී දින විසි එකක් ඇතුළත එම තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

6. පවත්නා හැඳුනුම්පත ඉල්ලුම්කරු වෙත තබා ගත යුතු අතර, පවත්නා හැඳුනුම් පත වෙනුවට කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අලුත් හැඳුනුම්පත ඉල්ලුම්කරු වෙත ලැබෙනතුරු එය වලංගු වන්නේ ය.

7. ඉල්ලුම්කරු විසින්, පවත්නා හැඳුනුම්පත සහතික කිරීමේ නිලධරයා වෙත භාර දුන් විට පමණක් අළුත් හැඳුනුම්පත ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, කොමසාරිස්වරයා වෙනුවෙන් පවත්නා හැඳුනුම්පත් එකතු කර ඔහු වෙත යැවීම සම්බන්ධයෙන් සහතික කිරීමේ නිලධරයා වගකිව යුතු ය.

8. (1) පවත්නා හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා රුපියල් විසි දෙකක ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තකුගේ දුගී භාවය මත කොමසාරිස්වරයා විසින් හෝ දිසාපති වරයකු විසින් හෝ උප දිසාපතිවරයකු විසින් හෝ, මේ නියෝග යටතේ ගෙවනු ලැබිය යුතු ගාස්තු අත්හරිනු ලැබිය හැකි අතර, එම ගාස්තුව සම්බන්ධයෙන් අත්හැරීමක් කළ බවට සහතිකයක් එම තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

9. මේ නියෝගවල—

"කොමසාරිස්වරයා" යන්නෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා වූ කොමසාරිස්වරයා අදහස් වේ; තවද "සහතික කිරීමේ නිලධරයා" යන්නෙහි 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතෙහි අර්ථය ම ඇත්තේ ය.

## උපලේඛනය

## 'ඉ' ආකෘති පත්‍රය

දිස්ත්‍රික්කය :————.

පු. ලි. දෙ./

උප දිසාපති කොට්ඨාශය :————.
ග්‍රාම සේවා නිලධාරි වසම :————.
ඉල්ලුම්පත් අංකය :————.

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්නා 1972 දී හෝ 1973 දී නිකුත් කරන ලද හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම් පතක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

1. ................................ වන මම, ...... ............... දින නිකුත් කරන ලද අංක
**(ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම)**

......................දරන මාගේ හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම්පතක් මාවෙත නිකුත් කරනු ලැබීම සඳහා 1990 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ අළුත් හැඳුනුම් පත් නිකුත් කිරීමේ) නියෝග යටතේ මෙයින් ඉල්ලුම් කරමි.

2. පරීක්ෂා කිරීම සඳහා සහතික කිරීමේ නිලධාරියා වෙත මේ සමග මා විසින් ඉදිරිපත් කරනු ලබන ඉහත කී හැඳුනුම්පත වෙනුවට එහි අනුපිටපතක් මා විසින් ලබාගෙන නොමැති බව මම ප්‍රකාශ කර සිටිමි.

3. අළුත් හැඳුනුම්පත මා වෙත නිකුත් කිරීමට පෙර, මගේ මුල් හැඳුනුම්පත කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම පිණිස, සහතික කිරීමේ නිලධරයා වෙත භාරදෙන බවට මම පොරොන්දු වෙමි.

4. මගේ ඡායාරූපයේ පිටපත් තුනක් මම මෙයි බහා එවමි.

5. අළුත් හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා ගාස්තුව වන රුපියල් විසිදෙකක (රු. 22.00) වටිනාකමින් යුත් අවලංගු නොකළ මුද්දර සහතික කිරීමේ නිලධාරියා වෙත මම භාර දුනිමි.

————.
ඉල්ලුම් කරුගේ අත්සන/වම් මාපට ඇඟිලි සලකුණ.

දිනය :————.
ලිපිනය :————.

**මා දැනට දරන හැඳුනුම්පතේ සටහන් කර ඇති පරිදි වූ විස්තර මම පහත දක්වමි**

අංකය :————.
නිකුත් කරන ලද දිනය :————.
නම :————.
වෙනත් නම් :————. ස්ත්‍රී/පුරුෂ :————.
උපන් දිනය :————. උපන් ස්ථානය :————.
රැකියාව :————.
ලිපිනය :————.

අළුත් හැඳුනුම්පතේ සටහන් කිරීම සඳහා වූ විස්තර මම පහත දක්වමි

නම :———.

වෙනත් නම් :———.

උපන් දිනය :———. ස්ත්‍රී/පුරුෂ :———.

රැකියාව :———. උපන් ස්ථානය :———.

ලිපිනය :———.

| මුද්දර | ඡායාරූප |
|---|---|

ඉහත දක්වා ඇති විස්තර මා හොඳින් දන්නා පරිදි හා විශ්වාස කරන අන්දමට සත්‍ය හා නිවැරදි බව මම ප්‍රකාශ කරමි.

———.

දිනය :———. ඉල්ලුම්කරුගේ අත්සන/වම් මාපට ඇඟිලි සලකුණ.

**සහතික කිරීමේ නිලධරයාගේ සහතිකය**

අංක............දරන හැඳුනුම්පත වෙනුවට අළුත් හැඳුනුම්පතක් සඳහා ඉල්ලීමක් කරන ......................... විසින් නිවැරදි විස්තර සපයා ඇති බවත්, (ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම)
මෙම ඉල්ලුම් පත්‍රයෙහි අලවා ඇති ඡායා රූපයද මෙහි බහා ඇති අංක .............දරන ඡායාරූප පිටපත් 2 ද, ඔහුගේම බවත්, දැනට ඔහු සතු හැඳුනුම්පත මවිසින් පරීක්ෂා කරන ලද බවත්, මම මෙයින් සහතික කරමි.

———.

දිනය :———. සහතික කිරීමේ නිලධරයාගේ අත්සන.

සහතික කිරීමේ නිලධරයාගේ නම :———.

තනතුර :———.

ලිපිනය :———.

......................... වෙතටයි. ඉල්ලුම්පත් අංකය :———

**ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දැන්වීම**

අළුත් හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබීම සඳහා ............................ වන දින .............. විසින් මා වෙත භාර දෙන ලද අංක ............. දරන ඉල්ලුම් පත්‍රය, කොමසාරිස්වරයා වෙත යැවීම සඳහා භාරගත් බව මම මෙයින් දන්වා සිටිමි.

———,

දිනය :———, සහතික කිරීමේ නිලධරයාගේ අත්සන.

ස්ථානය :———.

ඉල්ලුම්පත් අංකය :———.

27-2-1991

..............................

.............................. වෙතටයි.

**ඡායාරූප ශිල්පියා වෙත නිකුත් කරනු ලබන බල පැවරුම් ලිපිය.**

මෙය රැගෙන එන ........................ ගේ ඡායාරූපය ගෙන ශ්‍රීනා පිටපත් 3 ක් ඔහුට භාරදෙන මෙන් ඔබට මෙයින් නියම කරනු ලැබේ. එම ඡායාරූප පිටපත් වල පසු පැත්තේ මෙම ඉල්ලුම්පත් අංකය සටහන් කළ යුතුය.

———,
සහතික කිරීමේ නිලධරයාගේ අත්සන.

දිනය :———.

ස්ථානය :———.

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත 52(3) වන වගන්තිය යටතේ නිවේදනය**

ඉහත සඳහන් නියෝග 1990 අගෝස්තු මස 7 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. සී. රණතුංග,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

1990 ඔක්තෝබර් මස 04 වන දින,
කොළඹ දීය.

12-32

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
EXTRAORDINARY
අංක 637/6 — 1990 නොවැම්බර් 20 වැනි අඟහරුවාදා — 1990.11.20
No. 637/6—TUESDAY, NOVEMBER 20, 1990
(Published by Authority)

## PART I: SECTION (I)—GENERAL

### Government Notifications

L.D.—B2/71.

THE REGISTRATION OF PERSONS ACT, No. 32 OF 1968

REGULATIONS made by the President under subsection (4) of section 17 of the Registration of Persons Act, No. 32 of 1968 read with section 52 of that Act and Article 44 of the Constitution of the *Democratic Socialist Republic of Sri Lanka* and approved by parliament.

R. PREMADASA,
President.

Colombo, 25th June, 1990.

Regulations

1. These regulations may be cited as the Registration of Persons (Issue of new identity cards) Regulations 1990.

2. Every person who is the holder of an Identity Card issued in 1972 or 1973 shall apply to the Commissioner for the issue of a new Identity Card in replacement of the existing Identity Card with six months of the date of publication of these Regulations in the *Gazette*.

3. Any person who was issued with an Identity Card in 1972 or 1973 and has subsequently obtained a duplicate thereof shall not apply for a new Identity Card under regulation 2.

4. An application under regulation 2 shall—

(*a*) be in Form H set out in the Schedule hereto ;

(*b*) be signed by the applicant ;

(*c*) be certified by the Certifying Officer ;

(*d*) (*i*) if no certificate of waiver in respect of the fee prescribed by regulation 8 for the issue of a new Identity Card in replacement of the existing card has been issued to the applicant under paragraph (2) of that regulation, bear a stamp or stamps of the value of such fee ; or

(ii) if such certificate has been issued to the applicant, have such certificate attached to the application ;

(*e*) be accompanied by three unmounted copies of a recent photograph of the applicant of the dimensions specifications standard and quality prescribed by regulation 12 of Registration of

2. I declare that I have not obtained a Duplicate of the said Identity Card which I submit herewith to the Certifying Officer for inspection.

3. I undertake to surrender my original Identity Card to the Certifying Officer, to be forwarded to the Commissioner for Registration of Persons before the new Identity Card is issued to me.

4. I enclose three copies of my photograph.

5. I have handed in to the Certifying Officer uncancelled stamps of the value of Rupees Twenty Two (Rs. 22) being the fee for the issue of the new Identity Card.

Signature or Left Thumb
Impression of the Applicant.

Date :———.
Address :——— —.

I state below the particulars as recorded on the Identity Card that I now hold :———.

Number :———.
Date of Issue ———.
Name :———, Male/Female :———.
Other Names :———.
Date of Birth :———, Place of Birth :———.
Occupation :———.
Address :———.

I state below the particulars to be recorded on the new Identity Card :
Name :———, Male/Female :———.
Other Names :———.
Date of Birth :———, Place of Birth :———.
Occupation :———.

STAMPS

PHOTOGRAPH

I hereby declare that the particulars given above are, to the best of my knowledge and belief true and accurate.

———,
Signature or Left Thumb
Impression of Applicant.

Date :———.

*CERTIFICATE OF CERTIFYING OFFICER*

I hereby certify that——— (Full Name of Applicant) who applies for a new Identity Card in replacement of his Identity Card Number——— has furnished correct particulares; and that the photograph, one copy of which is affixed to this Application and 2 copies are enclosed, bearing No. ——— is that of the Applicant himself and that I have examined the Identity Card that he possesses.

———,
Signature of Certifying Officer.

Date :———.
Name of Certifying Officer :———.
Designation :———.
Address :———.

Application No. :———.

To :———.

*ACKNOWLEDGEMENT OF RECEIPT OF APPLICATION*

I hereby acknowledge receipt of Application No.——— for the issue of a new Identity Card made by ——— and handed over to me on————to be sent to the Commissioner for Registration of Persons.

———,
Singature of Certifying Officer.

Date :———.
Place :———.

Application No. :———.

*LETTER OF AUTHORITY ISSUED TO PHOTOGRAPHER*

To :———.

You are hereby directed to take the photograph of the bearer ——— and to issue 3 copies of it. The number of this Application should be noted on the reverse of the prints.

———,
Signature of Certifying Officer.

Date :———.
Place :———.

REGISTRATION OF PERSONS ACT, No. 32 OF 1968
Notification under section 52 (3)

IT is hereby notified that the above Regulations have been approved by Parliament on 7th August, 1990.

S. C. RANATUNGA,
Secretary,
Ministry of Defence.

Colombo, 5th November, 1990.
12—32

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA